ලිංගික අපයෝජනයට ලක්ව ඝාතනය කෙරී ඇතැයි කියැවෙන පාසල් සිසුවා සම්බන්ධ පුවෘත්තිය වාර්තා කිරීමේදී දිනමිණ, මව්බිම සහ ලංකාදීප පුවත්පත් එම සිසු දරුවාගේ ඡායාරූපය කිසිදු බොඳ කිරීමකින් හෝ සැඟවීමකින් තොරව පළ කොට තිබිණි. අරුණ සහ දිවයින පුවත්පත් මගින් එම සිසු දරුවාගේ ඡායාරූපය බොඳ කිරීමකින් යුතුව පළ කොට තිබිණි. එසේම මෙම සියළුම පුවත්පත් එම සිසුවාගේ නම අනාවරණය කොට තිබිණි.

ලිංගික අපරාධයකට/ලිංගික අපයෝජනයකට ලක් වූ අයෙකුගේ අනන්‍යතාවය හෙළිදරවු නොකිරීම මාධ්‍ය ආචාර ධර්මයක් ලෙසින් ජනමාධ්‍යවේදීන් පිළිපැදිය යුතු කරුණකි. යම් හෙයකින් එම ලිංගික අපරාධයකට/ලිංගික අපයෝජනයට ගොදුරු වූ අයවලුන් ජීවිතක්ෂයට පත්ව තිබුණද, වින්දිතයාගේ ඡායාරූප මාධ්‍ය ඔස්සේ පළ කිරීම යෝග්‍යද යන ගැටළුව මතුවේ. එහිදී වින්දිතයාගේ පවුලේ අයවලුන්ට ඒ ඔස්සේ විඳින්නට සිදුවන සිත්වේදනාවන් හා කම්පනයන්ද බැහැර කළ හැකි නොවේ.

මේ පිළිබඳව ඔබේ අදහස කුමක්ද?

#MediaEthicsSL #lka #SinhalaPress #News #Divaina #Lankadeepa #Dinamina #Aruna #Mawbima